# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 131/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 24/01/2024<br>පැය 1540 |

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම - මිරිහාන පොලිස් වසම.

2024.01.24 වන අද දින සවස් කාලයේ විරෝධතාකරුවන් පිරිසක් මිරිහාන පොලිස් වසමේ දෙල්කඳ හන්දියේ සිට නුගේගොඩ දක්වා හා කිරුළපන සිට නුගේගොඩ දක්වා වන හයිලෙවල් මාර්ගයේ විරෝධතා පා ගමනක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවට පොලිස් ස්ථානාධිපතිවරයාට තොරතුරක් ලැබී තිබිණි. ඒ අනුව එම ප්‍රදේශයේ අ.පො.ස. උසස් පෙළ විභාග මධ්‍යස්ථාන 04 ක් පැවැත්වෙන බැවින් එම විරෝධතා පාගමන තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව නුගේගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව නුගේගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සඳහන් වගඋත්තරකරුවන් වන

1. **කුමාර ගුණරත්නම්, ප්‍රධාන ලේකම්, පෙරටුගාමි සමාජවාදී පක්ෂය**
2. **පුබුදු ජාගොඩ, අධ්‍යාපන ලේකම්, පෙරටුගාමී සමාජවාදී පක්ෂය**
3. **ලහිරු වීරසේකර, වෙනසක ජාතික සංවිධානයේ ජාතික සංවිධායක**
4. **මංගල මද්දුමගේ, විප්ලවාදී ශිෂ්‍ය සංගමයේ කැඳවුම්කරු**
5. **ධම්මික මුණසිංහ, ඒකාබද්ධ සංවර්ධන නිලධාරි මධ්‍යස්ථානයේ කැඳවුම්කරු**
6. **වැම්පිටියේ සුගතානන්ද හිමි, ඒකාබද්ධ සෞඛ්‍ය සේවක සංගමයේ ප්‍රධාන ලේකම්**
7. **තැන්නේ ඥානානන්ද හිමි, රැකියා විරහිත උපාධිධාරි සංගමයේ කැඳවුම්කරු**
8. **හේමමාලි අබේරත්න, නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරයේ ජාතික සංවිධායිකා**
9. **වසන්ත මුදලිගේ, අන්තර් විශ්ව විද්‍යාල බල මණ්ඩලයේ හිටපු කැඳවුම්කරු**

සහ එයට සහභාගි වන වෙනත් තැනැත්තන් හට දෙල්කඳ හන්දියේ සිට නුගේගොඩ දක්වා සහ කිරුළපන සිට නුගේගොඩ දක්වා හයිලෙවල් මාර්ගය තුල විරෝධතා පාගමන් පැවැත්විම තහනම් කරමින් අධිකරණ නියෝගයක් නිකුත් කර ඇත.

අ.පො.ස. උසස් පෙළ විභාගට අද දින පෙනී සිටින සිසුන්ට විභාගය සඳහා නිසි අවධානයෙන් ක්‍රියා කිරීමට බාධාවක් ඇති විය හැකි බැවින් අධිකරණය මෙම නියෝගය නිකුත් කර ඇත.